# නිවසට ආ අමුත්තෝ



අනුපමා සෙව්වන්දි ජයසේකර

# නිවසට ආ අමුත්තෝ

අනුපමා සෙව්වන්දි ජයසේකර

# නිවසට ආ අමුත්තෝ

අනුපමා සෙව්වන්දි ජයසේකර

(කතා)

පාසල: මහාමායා බාලිකා විදුහල,මහනුවර

ඉගනුම ලබන පන්තිය: 6 ශ්‍රේණිය

ISBN : 978-624-208-867-9

# පිදුම

මාගේ පොත්වල අඩුපාඩු බලා

නිතරම මා ළඟ හිඳිමින්

මගේ සියලු දුක සැප බලන

මගේ අම්මාටත් අප්පච්චිටත්,

මට නිරතුරුවම උදවු කරන

මගේ ආදර මල්ලිලා,නංගි හා අයියාට

මම මෙම පොත

ආදරයෙන් පිළිගන්වමි.

# ස්තූතියි

# පෙරවදන



සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිම්පාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන “හෙරණ ගත්කරණී” ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එක දවසක් මම මල්ලියි නංගීයි එක්ක සෙල්ලම් කරන්න පාර පැත්තට ගියා. උදෙන්ම ගිය හින්දා අනිත් යාලුවොත් එක්ක අපි ගොඩක් වෙලා සෙල්ලම් කරා.

හොඳටම හවස් වෙනකං සෙල්ලම් කරලා, යාළුවොත් තම තමන්ගේ ගෙවල් වලට ගියා.




මම ගෙදර එනකොට එතන තිබ්බ කානුව යටින් අමුතු සද්දයක් ආවා. මම හැම තැනම බැලුවා. මට ඒ සද්දෙ හොයාගන්න අමාරු උනා.

හැබැයි මම වැඩේ අතැරියේ නැහැ. අන්තිමේට මම කාණුවට චුට්ටක් එබිලා බැලුවා.



මම දැක්ක දෙයින් පුදුම උනා. කානුව යටට වෙලා සද්ද කර කර ඉඳල තියෙන්නේ පොඩි බලු පැටව් දෙන්නෙක්.

ඉතිං හවස් වෙලා හින්දා මම මල්ලි යි නංගී යි එක්ක ගෙදර ගියා.



එළියට වෙලා මල් පැළ වලට සාත්තු කරමින් ඉන්නකොට අහස මන්දාරම් කරලා වහින්න ඔන්න මෙන්න තිබුණේ.



මට එකපාරටම කානුව යටට වෙලා හිටපු බලු පැටව් දෙන්නව මතක් උනා. මම ඉක්මනට පාර පැත්තට දුවලා ගියා.



මං බලු පැටව් දෙන්නා ව අරගෙන දුවලා දුවලා ගෙදරට ආවා. එයාලා හරි ම හුරතල්. හරිම කීකරුයි. අපි එයාලව නාවලා පිරිසිදු කරලා, පෙට්ටියකට පරණ රෙදි කෑලි ටිකක් දාලා නිදාගන්න තැනක් හදලා දුන්නා.



බලු පැටව් රට කාලා නැති හින්දා බඩ පිරෙන්න කෑම දීලා නිදාගන්න දුන්නා. ඉස්කෝලෙ ඇරිලා ඇවිත් හැමදාම අපි එයාලා එක්ක සෙල්ලම් කරනවා.



දැන් එයාලා ගොඩක් ලොකුයි. එයාල දැක්කහම මට හරිම සතුටුයි.



# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්.

**ISBN:978-624-208-867-9**